**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ නොවැම්බර් මාසයට අදාලව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවා ඇති රු.1,770,808 ක විදුලි වියදම සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණ අතර, එම මුදල රාජ්‍ය ආදායමට බැර කිරීමෙන් තොරව අදාල වැය විෂයයට අධිභාර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විදුලි වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. | වාර්තාකරන කාලපරිච්ඡේදයට අදාල වියදම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් පිළිඹිබු වන පරිදි නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යන්ත්‍ර සේවා කිරීම හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීමේ වියදම් අදාල වැය විෂයයන් යටතේ ගිණුම්ගත නොකර, වෙනත් වැය විෂයයට ගිණුම් ගත කර තිබීමෙන් එම වැය විෂයය රු.130,315ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂ අවසානයේදී නිවැරදිකිරීමට ජ'නල් සටහන් යෙදීම අතපසුවීමකින් සිදු කිරීමට නොහැකි වී ඇති බව සහ මෙවැනි වැරදි ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නා බව. | නිවැරදි වැය විෂයයට ගිණුම් ගත කළ යුතුය. |

(ආ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04කට අදාල සේවා පියස් / ග්‍රාම නිලධාරි කාර්යාල ගොඩනැගිලි 14ක් තක්සේරු කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | තක්සේරුකිරීමේ කටයුතු සිදුකර නොමැති ගොඩනැගිලි හඳුනා ගෙන කඩිනමින් තක්සේරු කිරීමේ කාර්යය නිමකිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස නිලධාරින්ට උපදෙස් ලබා දුන් බව. | තක්සේරු කර නොමැති ගොඩනැගිලි හඳුනා ගෙන කඩිනමින් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

(ඇ) නොසැසඳූ ගිණුම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.189,449,639 ක් හා භාණ්ඩාගාර පොත් අනුව රු.190,606,233 ක් වූයෙන් රු.1,150,694 ක නොසැසඳීමක් විය. | මේ සම්බන්ධව 2023.07.28 දින පත්කරන ලද කමිටුවේ නිර්දේශ සහිත වාර්තාව විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත්කර භාණ්ඩාගාරය වෙත උපදෙස් ලබාගැනීමට යොමු කර ඇති බව. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වෙනසට අදාල සැසඳුම් නොකළ ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2023 ජූලි 06 දිනැති ජාතික හැඳුනුම්පත් සඳහා ගාස්තු අයකිරීම් පිළිබඳ නිකුත් කළ ලිපියෙහි කරුණු අංක 02 හි 1 අනුව අයකරන ගාස්තු දිනපතා හෝ කෙටිකාලයක් (උපරිම සතියක කාලයක්) ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් අංශයට භාර දිය යුතු බව සඳහන් වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක වසම් 07 කට අදාල ග්‍රාම නිලධාරින් විසින් එකතු කරන ලද හැඳුනුම්පත් ලබා ගැනිමේ ගාස්තු, උක්ත විධිවිධානවලට අනුකූල නොවන ලෙස ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | සෑම සතියකම කාර්යාලයට පැමිණෙන දින මුදල් පියවීම සිදුකරන ලෙසට ග්‍රාම නිලධාරින්ට උපදෙස් දුන් බව. | එකතු කරන ලද ආදායම් විධිවිධාන ප්‍රකාරව ආදායම් ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල වූ ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,666ක් වූ අතර ශුද්ධ වියදම රු.මිලියන 1,447ක් වූයෙන්, පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මිලියන 219 හෙවත් සියයට 13 ක් ඉතිරි කර තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. පසුගිය වර්ෂවලට සාපේක්ෂව ප්‍රතිපාදන උපයෝගිතාවයෙන් යුතුව කටයුතු කර ඇති බව සහ මෙම ප්‍රතිශතය මීට වඩා අඩු කර ගැනීමට මාසික හා කාර්තු වශයෙන් ප්‍රගතිය සාකච්ඡා කිරීම කරන බව. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණ ලෙස හා නිවැරදිව පිළියෙල කිරීමත් ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමත් කළ යුතුය. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු.393,780 ක්ද, වැඩ තහනම් කළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.790,498 ක්ද, සේවය හැර ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු.532,954 ක්ද වශයෙන් 2023 දෙසැම්බර් 31 දින වනවිට වසර 01 ක සිට වසර 25 ක් අතර කාලයක සිට පැවත එන එකතුව රු.1,717,232 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බවත්, වැඩ තහනම් කළ නිලධාරියාට එරෙහිව නඩු පවරා ඇති බවත්, ඉතිරි ශේෂ 8 අයකර ගැනීමට උපදෙස් දී ඇති බවත්, සේවය හැර ගිය නිලධාරී ණය ශේෂ 2 ක් කපා හැරීමට ඉල්ලා ඇති අතර, තවත් ණය ශේෂ 2 ක් ඇපකරුවන්ගෙන් අයකරන බව. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගත යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පත් ගිණුම් 2 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් කර නොතිබූ එකතුව රු.250,200,701 ක තැන්පතු ශේෂයක් පැවතුණ අතර, එම ශේෂය තුල එකතුව රු.94,530,828 ක් වූ වසර 5 ක් | තවදුරටත් මු.රෙ. 571(3) විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අවස්ථාද පොදු තැන්පත් ගිණුම් සම්බන්ධව දක්නට ඇති බව සහ මේ සම්බන්ධව ගණකාධිකාරි මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේදි සාකච්ජා කර පසුවිපරම් සිදු කරන බව. | කල් ඉකුත් වූ තැන්පතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | ඉක්ම වූ තැන්පතු ද පැවතුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීම හෝ රජයේ ආදායමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි. | | |
| (ආ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06කට අදාලව රු.539,462ක්වූ ආබාධිත දීමනා, රු.2,108,069ක් වූ වැඩිහිටි දීමනා, රු.45,000ක්වූ රෝගාධාර දීමනා සහ රු.977,325ක්වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකා වන්දි ගෙවීම් දීමනා වශයෙන් අදාල ප්‍රතිලාභීන් විසින් ලබානොගත් දීමනා එකතුව රු.3,669,856 ක් ආපසු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට එවා තිබුණු අතර විධිමත් විමර්ශනයක් සිදු කර එම මුදල් ප්‍රතිලාභීන් හඳුනාගෙන ලබා දීමට කටයුතු කිරීම හෝ වැය විෂයයට අධිහාර කිරීම සිදු නොකොට පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | ප්‍රතිලාභියාට ගෙවීමට හෝ රජයේ ආදායමට බැරකිරිමට කටයුතු කරන බව. | අපේක්ෂිත අරමුණු ඉටු කිරීම සඳහා නිවැරදි ප්‍රතිලාභීන් හඳුනාගෙන ඔවුන්ට හිමි දීමනා නියමිත කාල සීමාව තුල ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විමධ්‍යගත ප්‍රග්ධන අයවැය වැඩසටහන යටතේ 2021 වර්ෂයට අදාලව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04ක ක්‍රියාත්මක නොකළ, අඩක් ක්‍රියාත්මක කළ සහ අවලංගු කළ ව්‍යාපෘති 53ක් අතරින් 39 ක් සඳහා භාණ්ඩ හා සේවා ලැබීමට පෙර එයට අදාල වවුචර් හා චෙක්පත් පිළියෙල කර රු.1,674,120ක වියදම් ගිණුම්ගත කර තිබුණි. අදාල ආයතන විසින් භාණ්ඩ සපයා නොතිබීම හේතුවෙන් එම මුදල සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. භාණ්ඩ හා සේවා ලැබීමට පෙර එයට අදාල වවුචර්පත් පිළියෙල කර චෙක්පත් පිළියෙල කිරීම වරදක් බව පිළිගන්නා බව. 2021 වර්ෂයේදී පැවති කෝවිඩ් ව්‍යවසනයත් සමඟ ඇති වූ ආර්ථික අර්බුධකාරී තත්වය සමඟ ද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම, සැපයුම්වල ඌණතාවය හේතුවෙන් චෙක්පත් ලබා නොදී ඊට අදාල භාණ්ඩ හා සේවා සැපයුම් සිදු නොකිරීමේ තත්වයක් පැනනැගුණද ප්‍රතිලාභීන්ට භාණ්ඩ හා උපකරණ ලබා දීමේ අදහසින් චෙක්පත් ලියා | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අදාල නිති, රිති හා චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව ක්‍රියාත්මක කළ යුතු අතර, භාණ්ඩ ලැබීමට පෙර වවුචර් පිළියෙල කර චෙක්පත ලිවීම සම්බන්දයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | |
|---|---|---|
| | තිබුණද ඊට අදාල සැපයුම් ඉටු කර ගැනීමට නොහැකි වුයෙන් ව්‍යාපෘතිවලට අදාලව ලියන ලද චෙක්පත් අවලංගු කර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ බව. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන ජේදය හා මාර්ගෝපදේශ අංක 12 හි උපදෙස් වලට අනුකූල නොවන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණ අතර, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කාර්යය මණ්ඩල විස්තර ඇතුළත් කර නොතිබීමත් ක්‍රියාකාරකම් සැලැස්ම තුළ එක් එක් වගකීම් ක්ෂේත්‍රය හා එයට අදාල ක්‍රියාකාරකම් හා එහි අපේක්ෂිත නිමවුම හා ප්‍රතිඵලය නිවැරදිව හඳුනාගැනීමත් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල විස්තර ඇතුළත් කර නොමැති බව සහ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීමේ එක් එක් අංශවල දෛනික කටයුතු විස්තරාත්මකව දක්වා ඇති පිළිගන්නා බවද 2024 වර්ෂයේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ ජීව වායු ඒකක 03 ක් ඉදිකිරීම, සමෘද්ධිලාභීන් සහ අඩුආදායම්ලාභීන් සඳහා වැසිකිළි 26 ක් ඉදිකිරීම, නිපුණ ශිල්පී තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් සකස් කිරීම සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 45ක් අධීක්ෂණය යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි. | අදාළ අමාත්‍යාංශ විසින් ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන යටතේ 2022 වර්ෂයට අදාලව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 12 ක රු.17,343,502කට අදාල ව්‍යාපෘති 78ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වර්ෂයේදී ගිණුම තැබීම කාර්තු වශයෙන් සිදු කිරීමට සැලසුම් කර තිබු අතර එම වර්ෂයේ මුල් කාර්තුවේදී පමණක් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ බව. රටේ පැවැති ආර්ථික අර්බුධකාරි තත්වය හේතුවෙන් භාණ්ඩ මිල ඉහල යාම, සැපයුම්කරුවන් විසින් සැපයුම් ඉටුකර අවසන් වුවද ඊට අදාල චෙක්පත් ලබා නොදීම නිසා එම සපයන ලද භාණ්ඩ ආපසු රැගෙන යාම, සැපයුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් නොකිරීම, කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රතික්ෂේප කිරීම මෙන්ම චක්‍රලේඛ මඟින් වියදම් සීමා කිරීම, නව ව්‍යාපෘති ආරම්භ කිරීම අත්හිටුවීමට උපදෙස් ලබා දීම වැනි හේතු නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වු බව. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අදාල නිතී, රිතී හා චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සේවා පියස් 03 ක් ඉදිකිරිම වෙනුවෙන් රු.5,228,434 ක් ද, සිතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා පියස් 05ක් ඉදි කිරීම සඳහා රු.5,309,169ක් හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා පියස් 04ක් ඉදි කිරීම සඳහා රු.4,075,194ක් වියදම්කර කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරිම් කටයුතු අවසන් කර නොමැති විම නිසා භාවිතයට ගත නොහැකිව පැවතුණි. තවද, සීතාවක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් රු.2,165,807ක වියදමක් දරා ඉදිකිරිම් කටයුතු අවසන් කර | ඉදිකිරීම පළමු අදියර, සම්බන්ධව සම්පූර්ණ සැලැස්මෙන් කොටසක් ප්‍රතිපාදන සීමාව තුල ඉටු කිරීම 2022 වර්ෂයේදී සිදු විය. මෙය පළමු කාර්තු තුල සිදු කල අතර එම වර්ෂයේදීම ඉතිරි කාර්තුවල දී ඉතිරි වැඩ නිම කිරීමේ අදහසින් ව්‍යාපෘතිය ආරම්භ කලද රටේ පැවැති ආර්ථික අර්බුදකාරී තත්වය හමුවේ 2022 වර්ෂයේ 2,3,4 කාර්තු වලදී ව්‍යාපෘති ඉදිරි කටයුතු කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘති වලට අදාලව ඉතිරි වැඩ කිරීම 2024 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ මුදල් වෙන්කල නොහැකි වු අතර කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති දෙකක ඉදිරි සංවර්ධන කටයුතු කඩුවෙල මහනගර සභා පොදු අරමුදලින් ඉටු කිරීමේ එකඟතාවය ලැබී | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර ඒවා උපයෝජනයට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු සේවා පියසක් භාවිතයට ගෙන නොතිබුණ බවත් නිරීක්ෂණය විය. | ඇත.<br>වැලිහිඳ බහුකාර්ය ගොඩනැගිල්ල පළමු මහලේ සේවා පියසට අයත් කොටස සංවර්ධන කටයුතු කිරීම බිම් මහල දක්වා වැඩ අවසන් කර ඇත. බිම් මහලේ වසමේ සංවර්ධන නිලධාරි රාජකාරි කටයුතු කිරීම සඳහා කාර්යාල කටයුතු වර්තමානය වන විට පවත්වාගෙන යනු ලබන අතර, එම ගොඩනැගිල්ලේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කර අවසන් කරන තෙක් අධීක්ෂණය කරනු ලබන බව. | |
| (ආ) | 2022 වර්ෂයේ සිදුකළ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4ක ක්‍රියාත්මක කරනු ලැබූ නිෂ්පාදන ගම්මානවල එකතුව රු.836,970ක උපකරණ හා ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 09 දෙනකු එම ව්‍යාපෘති කටයුතුවලින් ඉවත්වී තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. මෙම ගිවිසුම්ගත වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විදුලිය අවශ්‍යතාවය මූලික යටිතල පහසුකමක් ලෙස පැවතිය යුතු වුවත් රටේ පැවති නිරන්තර විදුලි කප්පාදුව නිසා මෙම කර්මාන්ත පවත්වාගෙන යෑමට බාධා ඇතිවීමෙන් එම ප්‍රතිලාභීන් වෙනත් රැකියාවලට යොමුවී ඇති බව. | ඉවත් වූ ප්‍රතිලාභීන්ට ලබා දුන් උපකරණ හඳුනාගෙන උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්ව වෙත ලබා දිය යුතු අතර පසු විපරම් කටයුතු ශක්තිමත් කළයුතුය. |
| (ඇ) | ස්ථිර කාබනික පොහොර අලෙවිසැල් 3ක් ආරම්භ කිරීම, නිෂ්පාදන ව්‍යවසායකින් 20 ක් බිහි කිරීම හා කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කොරතොට කාබනික පොහොර නිෂ්පාදන ගම්මානය ආරම්භ කර තිබුණි. ඒ යටතේ රු.488,480 ක උපකරණ ලබා දී පුහුණුව ලබා දුන් ප්‍රතිලාභීන් 13 දෙනෙකු ව්‍යාපෘතියෙන් ඉවත් වීමත්, රු.975,000 ක් වැයකර නිෂ්පාදන සමිතියට ලබා දුන් ෂේඩර් යන්ත්‍ර 05 ව්‍යාපෘතියට යෙදවීමෙන් තොරව ගෙවතු වගාවට අවශ්‍ය පොහොර | 2021 වර්ෂයේදී රජය විසින් රසායනික පොහොර භාවිතය සීමා කිරීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හේතුවූ මූලික කරුණක් විය. නමුත් පසුව රජය විසින් රසායනික පොහොර භාවිතය සම්බන්ධයෙන් සීමාවන් පැනවුවත් ඊට විරෝධතාවයන් ගොවි සංවිධානවලින් මතුවිය. ඒ අනුව කාබනික පොහොර නිෂ්පාදන ගම්මානයද කඩා වැටීමට සිදු විය. එම නිසා කාබනික පොහොර නිෂ්පාදන ගම්මාන සම්බන්ධ ප්‍රතිලාභීන් ලෙස කටයුතු කල දහතුන්දෙනා කාබනික පොහොර නිෂ්පාදනයෙන් ඉවත් වී වෙනත් රැකියා කරා යොමු වීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබිණි. කෙසේ වෙතත් කාබනික පොහොර නිෂ්පාදනයේ | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර ඒවා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිපදවීමට භාවිතා කිරීමත් හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගෙන නොතිබුණි. | නියැලෙන පුද්ගලයන් තව දුරටත් හඳුනා ගැනීමට කටයුතු කරන අතර, දැනට භාවිතයේ නොමැති උපකරණ විධිමත්ව ඔවුන්ට ලබා දීමට කටයුතු කිරීම තුළින් ද කඩුවෙල කොට්ඨාශය ආවරණය වන පරිදි කාබනික පොහොර නිෂ්පාදනය හා අලෙවි ගම්මානය ඇති කිරීමට කටයුතු කරන බව. | |
| (ඇ) | කාබනික පොහොර සහ කිරි ගොවි නිෂ්පාදන ගම්මාන දෙකට අදාලව කාබනික පොහොර අලෙවි කිරීම සඳහා කඩුවෙල නගර සභාවට අයත් ඉඩමක ශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් රු.2,926,829ක් ද කිරි නිෂ්පාදන අලෙවි කිරීම ඇතුළු සමිතියේ ප්‍රවර්ධන කටයුතු සඳහා කඩුවෙල නගර සභාව සතු ඉඩමක පිහිටි ගොඩනැගිල්ලක පහත මහලේ වැඩ නිමකිරීම වෙනුවෙන් රු.2,926,829ක් ද වශයෙන් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.5,853,658ක් වියදම් කර තිබුණි. නමුත් එම ව්‍යාපෘති අසාර්ථක වීම මත සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මෙම ගොඩනැගිලි දෙක යෝජිත අරමුණ සඳහා භාවිතා නොවන බව නිරීක්ෂණය විය. | ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුණ වූ කාබනික පොහොර නිෂ්පාදනය එවකට රටේ පැවති ආර්බුධකාරී තත්වය මත හා විරෝධතා නිසා කඩා වැටුන අතර, කිරි නිෂ්පාදන හා අලෙවි කිරීමේ ප්‍රවර්ධන කටයුතු ද අඩාල වීම හේතුවෙන් ප්‍රතිලාභීන් වෙනත් රැකියා සඳහා යොමු විය. එහෙත් නිෂ්පාදන ගම්මාන දෙකට අදාල පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ඉදිකරනු ලැබූ ගොඩනැගිලි දෙක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සමිතිවල කමිටු රැස්වීම් හා මහා සභා රැස්වීම් පැවැත්වීමට සහ වසම්භාර සංවර්ධන නිලධාරි හා සමෘද්ධි සංවර්ධන නිලධාරි කාර්යාල කටයුතු සඳහා ද භාවිතා කරනු ලබන බව. ඉතිරි වැඩ කටයුතු නිම කිරීම සම්බන්ධව කඩුවෙල මහනගර සභා පොදු අරමුදල යෙදවීමට එකඟතාවයද ලැබී ඇති අතර, සෞභාග්‍යා නිෂ්පාදන වැඩසටහන සාර්ථක කර ගැනීමට අවශ්‍ය පසුවිපරම් කටයුතුද සිදු කරන බව. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට 2017 ජනවාරි මාසයේදී කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණද, ඉදි කිරීම් අතරමඟ නතර කර දැමීම හේතුවෙන් 2018 ජූලි මාසයේදී කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුම අවලංගු කර 2021 අප්‍රේල් මාසයේදී නව කොන්ත්‍රාත්කරුවෙකු වෙත ඉදිකිරීම් නිම කිරීමට භාර දී තිබුණි. එහෙත් 2024 මැයි 31 දින වනවිට ඉදිකිරීම් කටයුතු සඳහා රු.271,786,566 ක් වැය කර තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා භාවිතයට ගත හැකි ලෙස ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. ඉදි කිරීම් කටයුතු සඳහා 2018, 2019, 2020 හා 2023 වර්ෂවල වෙන්කළ ප්‍රතිපාදන මුදලින් පිළිවෙලින් රු.මිලියන 180, 188, 57.5 හා 43.5 ක් උපයෝජනය කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. | මේ වන විට පළමු මහල හා දෙවන මහලේ වැඩ කටයුතු බොහොමයක් සිදු කර අවසන්ව ඇති අතර විදුලි සම්බන්ධතාව ලබා ගැනීම ඇතුළු සීමිත වැඩ කොටසක් නිම කිරීමට පවතී. මේ සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටුව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව 2024 මැයි 07 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වූ අතර එහිදී ගනු ලැබූ තිරණ අනුව මෙම ගොඩනැගිල්ලේ පළමු හා දෙවන මහල භාවිතය සඳහා වැඩ නිම කිරීම මාසයක් තුල නිම කිරීමට එකගතාවය පලවූ බව. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අප්‍රමාදව නිමකර භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය |

## 3.5 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවීම හා මිය ගිය විශ්‍රාමිකයන් වෙත විශ්‍රාම වැටුප් ගෙවා තිබීම වැනි විවිධ හේතු මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් මගින් විශ්‍රාමිකයන් 143 දෙනෙකු වෙත 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප්, | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. මෙම රු.17,350,169ක් වූ මුදලින් කොටසක් අයවීම සිදු වන අතර වසර 10ට වැඩි අයවීම් අතර රු.46,150ක මුදල පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යලයට අදාල බවද, විශ්‍රාමිකයා මියයාම නිසා අයවීම නතර වී ඇති බව සහ මේ පිළිබඳව මු.රෙ. 104 අනුව සකසන ලද වාර්තා විශ්‍රාම වැටුප් | වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල් නොපමාව අයකරගත යුතු අතර විධිමත් පරීක්ෂණයක් පවත්වා වැඩිපුර ගෙවීම් සඳහා වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාරිතෝෂික හා දීමනා මුදල රු.17,350,169 ක් බව නිරීක්ෂනය විය. එම මුදලින් රු.15,302,073 ක් වර්ෂ 05 කට අඩු කාලයක්ද, රු.2,001,945 ක් වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් අතර කාලයක් හා රු.46,150ක් වර්ෂ 10 වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. තවද, සීතාවක සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව වැඩිපුර ගෙවීම් අයකරමින් පැවති විශ්‍රාමිකයන් 05 දෙනෙකු මිය යාම හේතුවෙන් එකතුව රු.1,041,700 ක් අයකර ගැනිම සිදුකළ නොහැකිව පැවතුණි. | දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | |
| (ආ) | විශ්‍රාමිකයා මියගිය බව තහවුරු කර ගන්නා විටත් එම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට බැරවී තිබීමෙන් කඩුවෙල සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යලවලට අදාලව මියගිය පිළිවෙලින් විශ්‍රාමිකයන් 87 දෙනෙකුට හා 3 දෙනෙකුට අදාල වැඩිපුර ගෙවා ඇති පිළිවෙලින් රු.5,506,152ක් සහ රු.999,256ක විශ්‍රාම වැටුප් නැවත අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. | මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව යාවත්කාලීන කලයුතු අතර බැංකුවෙන් මුදල් ලබාගත් පාර්ශව වෙතින් නොපමාව එම මුදල් අයකරගත යුතුය. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ සමිති 124 ක් ලියාපදිංචි කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 88ක් අක්‍රීයව පැවති අතර | ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ග්‍රාම ශක්ති කාර්යාලය හරහා ක්‍රියාත්මක වූවකි. මෙම ග්‍රාම ශක්ති සමිති සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වූ අතර ග්‍රාම ශක්ති කාර්යාලය විසින් දැනුම් දුන් පරිදි ආරම්භක සමිති ලියාපදිංචි ගාස්තු හා ග්‍රාම ශක්ති වැඩසටහන | නිවැරදි උපදෙස් හා වැඩපිළිවෙලක් යටතේ මුදල් උපයෝජනය කරමින් වැඩසටහන ඵලදායීව ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| එදිනට එම සමිති වලට අදාල ග්‍රාම ශක්ති මව් සමිති ගිණුමෙහි රු.30,773,717ක් ද ක්ෂුද්‍ර මූල්‍ය ගිණුමේ රු.4,291,189ක් වශයෙන් බැංකු ගිණුම්වල ශේෂව පැවති රු.35,064,906ක මුදල් ඵලදායී කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. | පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපාදන ලබා දුන් නමුත් පසුව ලියාපදිංචිය අලුත් කිරීම හෝ සමිති පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු වුයේ නැත. මෙම සමිතිවලට අදාල ග්‍රාම ශක්ති මව් ගිණුම්වල සහ ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම්වල පැවති ශේෂයන් සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ගයන් සම්බන්ධව උපදෙස් ලැබී නොමැති බව. | |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවලදී රත්මලාන, කඩුවෙල හා මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් විශ්‍රාම වැටුප් ලිපිගොනු 34ක්, 120ක් හා 231ක් අස්ථාන ගතව තිබුණි. අස්ථානගත වූ ගොනු අස්ථානගත වූයේ කවදා ද, කුමන නිලධාරියෙකු භාරයේ තිබියදී ද යනවග හා ඒවා අස්ථානගත වීමට හේතුව අනාවරණය කරගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව හා තාවකාලික ගොනු සකස්කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව සහ විශ්‍රාම වැටුප් විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලිය යටතේ වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මාරු කරන ලද සමහර විශ්‍රාමිකයින්ගේ ලිපිගොනු නොමැතිව දත්ත පද්ධතිය මගින් මාරු කර ඇති බව. | විශ්‍රාම වැටුප් ගොනු හා ලේඛන නඩත්තුව හා ආරක්ෂාව සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර අස්ථානගත වූ ගොනු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කළ යුතුය. |
| (ආ) | මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව විශ්‍රාමිකයා විසින් ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා, 2021, 2022 සහ 2023 වර්ෂවලදී පිළිවෙලින් 06ක්, 36ක් සහ 39ක් වශයෙන් විශ්‍රාමිකයන් 81 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවා තිබුණි. එකී විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේදී මිය ගිය විශ්‍රාමිකයන් 02 දෙනෙකුට මාස 07 බැගින්ද, එක් | ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවා තිබුණු විශ්‍රාමිකයන් 81 දෙනා අතරින් මේ වන විට 35 දෙනෙකුගේ තොරතුරු සොයා ගත් බව සහ මිය ගිය විශ්‍රාමිකයන් 03 දෙනාගෙන් දෙදෙනෙකුගේ බැංකු ගිණුම්වල මුදල් පවතින බැවින් එම මුදල් ගෙන්වා ගැනිමටද, බැංකුවේ මුදල් නොමැති අනෙක් තැනැත්තාගේ භාරකරුවන්ට මුදල් ගෙවන ලෙස දැන්වූ බව. | ජීවිත සහතික ලබාදී නොමැති විශ්‍රාමිකයන් පිළිබඳව පසු විපරම් කිරීම අප්‍රමාද සිදු කර විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අවස්ථා අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විශ්‍රාමිකයෙකුට මාස 15ක්ද විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි. | | |
| (ඇ) | රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බල ප්‍රදේශය තුළ ඇති අනවසරයෙන් රජයේ ඉඩම් බුක්ති විදින /පදිංචිව සිටින ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුව අනුව පුද්ගලයන් 03 ක් හා පුද්ගලික ආයතනයක් විසින් හෙක්ටයාර් 0.31ක ඉඩම් ප්‍රමාණයක් අනවසරයෙන් පදිංචිව භුක්ති විදින බව අනාවරණය වුවද, සන්තකය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | අනවසරයෙන් රජයේ ඉඩම් බුක්ති විදින /පදිංචිව සිටින ඉඩම් පිළිබඳ ලේඛනයක් මේ වන විට පවත්වාගෙන යන බව හා සන්තකය ලබා ගැනිම සඳහා නඩු කටයුතු සිදුකරමින් පවතින බව. | අනවසරයෙන් රජයේ ඉඩම් බුක්ති විදින පුද්ගලයින් සම්බන්ධව නිත්‍යානුකූලව කටයුතු කර එම ඉඩම්වල සන්තකය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන තිබුණු බවට 2023 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 32 කට අදාලව තිරසාර සංවර්ධන අරමුණු 12 ක් යටතේ දර්ශක 187ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 18ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක්ද දර්ශක 34ක ප්‍රගතිය සියයට 50 ක සිට සියයට74ක් අතර අගයකද පැවතුණි. | විදුලි පද්ධති අලුත්වැඩියාව සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක කාර්යන් ආරම්භ කර නොතිබීම, අදාල ප්‍රතිපාදන නොමැතිවීම, බැංකු පොලී අනුපාතය ඉහල යාම නිසා ව්‍යවසායකයින් ආයෝජනයට ඉදිරිපත් නොවීම, ඉඩම් පරිහරණ අංශයට අදාල ව්‍යාපෘති යාවත්කාලීන වැඩසටහනක් බැවින් එය 2024 වර්ෂයටද ඉටු කිරීමට නියමිත බව. | තිරසර සංවර්ධනය උදෙසා තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු කළ යුතුය. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන අංශය විසින් 2023 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව විගණන විමසුම් 42ක් නිකුත් කර තිබුණු අතර එය විගණන සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 50ක් පමණක් විය. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. 2024 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව කාර්ය සාධනය අත්පත් කර ගැනීමට කටයුතු කරන ලෙසට නිලධාරින්ට උපදෙස් ලබා දුන් බව. | විගණන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

**6. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා අනුමත සමස්ත සේවක සංඛ්‍යාව 1,423ක් ද, තත්‍ය සේවක සංඛ්‍යාව 1,511ක් ද විය. එදිනට , පුරප්පාඩු සේවක සංඛ්‍යාව 271 ක් හා සංවර්ධන නිළධාරී තනතුර 359ක අතිරික්තයක් පැවතුණි. පුරප්පාඩු සේවක සංඛ්‍යාව තුල මහජනතාවට සෘජු සේවා සපයන ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු 121ක් පැවතුණි. | රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ගතකිරීමේ වැඩසටහන යටතේ පුහුණුවට යොමු කළ සංවර්ධන නිලධාරින් ස්ථිර සේවයට පත් කිරීමට අදාලව රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලබා දුන් උපදෙස් අනුව මෙම සංවර්ධන නිලධාරින්ගේ අතිරික්තය ඇතිවී තිබෙන බව.<br>පුරප්පාඩු ග්‍රාම නිලධාරි තනතුරුවලට අදාල වසම් සඳහා වැඩබැලීමේ පත්වීම් සිදු කර ඇති බවද, අනිකුත් පුරප්පාඩු සම්බන්ධව රාජකාරී ඉටුකිරීම හෝ වැඩ බැලීමේ පත්වීම් ලබා දීම. | විධිමත් අධ්‍යනයක් සිදු කර අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරිමට හෝ / හා නැතහොත් අදාල පුරප්පාඩු පිරවීමටද කටයුතු කල යුතුයි. |
| (ආ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 08ක, 1997 වර්ෂයේ සිට 2023 වර්ෂය අතර කාලසීමාව තුල විවිධ හේතුන් නිසා වැඩ තහනම් කළ නිලධාරින් 16 දෙනෙකු සිටින බවද, ඔවුන්ගෙන් 09 දෙනෙකුගේ වැඩ තහනම් කර වසර 10කට වඩා කාලයක් ගතවී තිබුණද, එම නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් වී නොතිබුණ බව නිරීක්ෂණය විය. | නිලධාරින්ගෙන් පිරිසක් වසර 10කට වැඩි කාලයක් වැඩ තහනමට ලක්වී ඇති බව සහ ඔවුන් සම්බන්ධ පරික්ෂණ අවසන් කිරීමට කටයුතු කරන බව. | වැඩ තහනම් කළ නිලධාරින් සම්බන්ධ පරීක්ෂණ අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව එකම සේවා ස්ථානයක වසර 05 ට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වන බව දක්වා තිබුණද, 2023 ජූලි හා 2023 සැප්තැම්බර් මාස වනවිට කැස්බෑව හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් පිළිවෙලින් 96 හා 50 ක් විය. ඒ අතරින් පිළිවෙලින් නිලධාරීන් 8 ක් හා 44 ක් වසර 10 කට අධික කාලයක සිට එම කාර්යාලවල සේවය කරන බව නිරීක්ෂණය විය. | වාර්ෂික ස්ථාන මාරු තොරතුරු වලට අදාලව වසර 05 වැඩි සියලු නිලධාරින්ගේ නම් ලැයිස්තු තනතුරු අනුව වෙන් වෙන්ව සකස් කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත යොමු කර ඇති බව. | වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වන නිලධාරීන් පිළිබඳ තොරතුරු අදාල පරිදි ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 2019 සැප්තැම්බර් 04 දින සිට වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කරගත් කැස්බෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කළ සංවර්ධන නිලධාරිනියක් 2022 සැප්තැම්බර් 04 දින නැවත සේවයට වාර්තා කළ යුතුව තිබුණද, අදාළ පරිදි කටයුතු කර නොතිබුණි. ඒ අනුව සේවය අත්හැර යාමේ නිවේදනයක් ඇය වෙත නිකුත් කර තිබුණද, ආයතන සංග්‍රහයේ XII - 16:5 වගන්තියේ 10 වැනි පරිශිෂ්ඨය ප්‍රකාරව 2019 අගෝස්තු 20 දින නිලධාරිනිය සමඟ අත්සන් කරන ලද ගිවිසුමෙහි IV වගන්තිය ප්‍රකාරව නැවත සේවයට වාර්තා නොකිරීම මත රජයට අය කර ගත යුතු රු.675,136 ක දණ්ඩන මුදල අයකරගෙන නොතිබුණි. | එම දණ්ඩන මුදල අය කර ගැනීමට කටයුතු කරන ලෙසට නිලධාරින්ට උපදෙස් ලබා දුන් බව. | ආයතන සංග්‍රයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර දණ්ඩන මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | | |
| **i.** | චක්‍රලේඛයෙහි 6.4 වගන්තියට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආයතන මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී නිලධාරීන්ට ලබාදිමට අපේක්ෂිත ඩිප්ලෝමා පාඨමාලා/ පශ්චාත් උපාධි පාඨමාලා පිළිබඳ හඳුනා ගෙන නොතිබියදීත්, නිලධාරීන් තිදෙනෙකු සඳහා ඩිප්ලෝමා පාඨමාලා හා පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා කාර්ය මණ්ඩල පුහුණු වියදම් යටතේ රු.564,000 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. | 2024 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී විගණන නිරීක්ෂවලට අවධානය යොමු කර සිදු කරන බව දිස්ත්‍රික් නිලධාරින් පුහුණු කිරීමේ අභිලාශය ඇතිව සම්පත් දායකයකු නිර්මාණය කරගැනීමේ අදහසින් මෙම නිලධාරීන් තිදෙනා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා යොමු කළ බව හා සේවා ව්‍යවස්ථාව අනුව කළ යුතු පශ්චාත් උපාධි පාඨමාලාවක් බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී එක් එක් සේවකයා/ නිලධාරියා විසින් දක්වා ඇති පුහුණු අවශ්‍යතා කෙරෙහි අවධානය යොමුකිරීම කළ යුතු අතර, ඉන් බැහැරව කටයුතු නොකළ යුතුය. |
| **ii.** | චක්‍රලේඛයේ 6.1 වගන්තිය අනුව මානව සම්පත් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවන් ලබා දීම තහවුරු වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු සැලැස්ම සකස් කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. | 2024 වර්ෂයට ආදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇති බව එම සැලැස්මට අනුව පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන බව හා ප්‍රගතිය කාර්තු වශයෙන් ලබාගැනිමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව පුහුණු අවශ්‍යතා සැලැස්ම සකස් කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. |